වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

மருத்துவப் பட்டப் பின்படிப்பு நிறுவகம்

POSTGRADUATE INSTITUTE OF MEDICINE



වාර්ෂික වාර්තාව 2020

வருடாந்த அறிக்கை 2020

ANNUAL REPORT 2020

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

වාර්ෂික වාර්තාව **2020**

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

නො.160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත,කොළඹ 07

දුරකථන: (+94) 112 697758
(+94) 112 681052
(+94) 112 696261

වෙබ් අඩවිය: https://pgim.cmb.ac.lk

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

මහාචාර්ය සේනක රාජපක්ෂ
අධ්‍යක්ෂක
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

මහාචාර්ය එස්.සිවගනේෂ්
නියෝජ්‍ය අධ්‍යක්ෂක
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

එස්.අනූෂා
නියෝජ්‍ය ලේඛකාධිකාරී
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

දැක්ම

රටෙහි සහ කලාපයෙහි සෞඛ්‍ය අවශ්‍යතා සැපිරීම සහ ලෝක සෞඛ්‍යය ප්‍රවර්ධනයට සහාය වීම උදෙසා ඉහළම කාර්‍යක්ෂමතාවකින් යුත් විශේෂඥවරුන් සහ අනෙකුත් වෘත්තිකයන් බිහිකිරීම සඳහා අවශ්‍ය පශ්චාත් අධ්‍යයන වැඩසටහන් සැලසුම් කිරීම සහ සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය පිලිබඳව වන ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම.

<u>මෙහෙවර</u>

ශ්‍රී ලාංකීය ජනතාවට, කළාපයට සහ ලෝකයට ප්‍රශස්ත සහ මානුෂික සෞඛ්‍ය සත්කාරය සැලසීම වෙනුවෙන් ඉහළම ගුණාත්මකභාවය, ප්‍රවීණත්වය සහ කැපවීම සහිත විශේෂඥවරුන් සහ අනෙකුත් වෘත්තිකයන් බිහිකිරීම සඳහා අවශ්‍ය පශ්චාත් අධ්‍යයන වැඩසටහන් සැලසුම් කිරීම සහ සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.

අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය



2020 වර්ෂය සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව අතිශයින්ම සතුටුවෙමි.

ශ්‍රී ලංකාව තුළ වෛද්‍ය වෘත්තිකයන් සහ දන්ත වෛද්‍ය වෘත්තිකයන් හට විශේෂඥ පුහුණු සැපයීම සඳහා පවතින එකම ආයතනය වන්නේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයයි. එතුළ වර්තමානය වනවිට ක්‍රියාත්මක වන අධ්‍යයන මණ්ඩල 23ක් සහ විශේෂ මණ්ඩල 37ක් යටතේ එම්.ඩී සහ එම් එම්.එස්.සී උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා පශ්චාත් උපාධි සහතික පත්‍ර සහ විශේෂඥ වෛද්‍යවරුන් සඳහා මණ්ඩල සහතිකධාරීත්වය පිරිනැමීම දක්වා දිවෙන අධ්‍යයන වැඩසටහන් 135 ක් අප විසින් පවත්වන ලදී. මේ වනවිට නව බඳවාගැනීම් 986 කින් සමන්විත වූ සහ සමස්තයක් ලෙස 3855 ක් වූ පශ්චාත් උපාධි පුහුණුලාභීන් සංඛ්‍යාවක් ඉහත පුහුණු වැඩසටහන් සඳහා ලියාපදිංචිව සිටිති. 2020 වර්ෂයේදී අප විසින් විභාග 115 ක් පැවැත්වූ අතර එම්.ඩී උපාධි 434 ක් සහ එම් එම්.එස්.සී උපාධි 61 ක්ද, පශ්චාත් උපාධි ඩිප්ලෝමාවන් 186 ක්, පශ්චාත් උපාධි සහතික 10 ක් සහ විශේෂඥ වෛද්‍යවරුන් සඳහා මණ්ඩල සහතිකධාරීත්වයන් 235 ක් පිරිනැමීමද සිදු කරන ලදී.

හමුදා වෛද්‍ය විද්‍යාව පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය, පර්යේෂණාගාර අණුක ව්‍යාධිවේදය පිලිබඳව එම්.ඩී. උපාධිය සහ මණ්ඩල සහතිකකරණය, සායනික ජාන විද්‍යාව පිළිබඳව පශ්චාත් එම්.ඩී. උපවිශේෂ පුහුණුව සහ මණ්ඩල සහතිකකරණය යන නව පුහුණු වැඩසටහන් තුන සඳහා උපාධි ප්‍රකාශපත්‍ර සැකසීම අවසන් කරනු ලැබිණි. පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් දෙකක් ශාස්ත්‍රපති මට්ටම දක්වා ඉහළ දැමිණි. 2019 වසරේදී පවතින වැඩසටහන්හි විෂය මාලා සහ උපාධි ප්‍රකාශපත්‍ර 3 ක් ප්‍රතිශෝධනය කරන ලද අතර තවත් 12 ක් ප්‍රතිශෝධනය වෙමින් පවතී.

රොඩ්නි වීදියේ ඉදිකෙරුණු අපගේ නව අධ්‍යයන ගොඩනැගිල්ලේ කටයුතු නිමා කරන ලද අතර 2019 අගෝස්තු මස සිට එහි වැඩකටයුතු අරඹන ලදී. ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය දැව භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ ආයතනයේ පොදු අරමුදල් භාවිතා කරමින් මිලදී ගනු ලැබිණි.

කොවිඩ් 19 හේතුවෙන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට නවතම ආකාරයේ අභියෝගයන් රැසකට මුහුණ දීමට සිදුවිය. කොවිඩ් වසංගතය හේතුවෙන් සිදුවූ රට වසා දැමීම් ඇතුළු අනෙකුත් සීමා කිරීම් හමුවේ පවා, බොහෝ ක්‍රියාකාරකම් මාර්ගගත අයුරින් සිදුකිරීමට යොමුවීම ඔස්සේ සහ කඩදාසි භාවිතයෙන් තොර කාර්යාලයක් පවත්වාගැනීම වෙත යොමුවීම මගින් පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය විසින් ඉතා ඉහළ මට්ටමේ ක්‍රියාකාරීත්වයක් පවත්වාගෙන යාමට සමත් විනි. ඒ සමගම වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, තම කාර්ය මණ්ඩල, පුහුණු කරුවන්, සහ පුහුණු ලාභීන් යන පාර්ශ්වයන්ගේ සුරක්ෂිත බව තහවුරු කරනු පිණිස ජාතික මාර්ගෝපදේශයන් අනුව යමින් සෞඛ්‍යාරක්ෂිත උපායමාර්ගයන් ද අනුගමනය කරන ලදී.

මෙම කටයුතු සාර්ථකව ඉටුකිරීමෙහි ලා පශ්චාත් අපාධි වෛද්‍ය විද්‍යා ආයතනයට දැක්වූ දායකත්වය පිළිබඳව එහි කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්, අධ්‍යයන මණ්ඩල, විශේෂඥ අධ්‍යයන මණ්ඩල සහ විභාග මණ්ඩල සාමාජිකයන්, පුහුණුකරුවන් සහ විභාග පරීක්ෂකයන් හට මාගේ ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම තම රාජකාරී ප්‍රශංසනීය අන්දමින් ඉටුකර ඇති අපගේ පරිපාලන සහ ලිපිකාර කාර්ය මණ්ඩලයටද මාගේ ස්තුතිය හිමිවේ.

මහාචාර්ය සේනක රාජපක්ෂ
අධ්‍යක්ෂ/වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අන්තර්ගතය

1. කළමනාකරණ මණ්ඩලය..... 7

2. සම්පත් හා සිසුන් පිළිබඳව විස්තර 9

3. දේශීය සිසුන් පිළිබඳව විස්තර..... 9

4. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර..... 9

5. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර..... 10

6. පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර..... 11

7. නව පාඨමාලා පිළිබඳ විස්තර..... 11

8. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර .....'12

9. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර.....12

10. මූල්‍ය ප්‍රගතිය (වියදම්) පිළිබඳ විස්තර..... 12

11. මූල්‍ය ප්‍රගතිය (උත්පාදනය කරන ලද ආදායම්) පිළිබඳ විස්තර..... 13

12. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය 2020..... 13

13. 2020 වර්ෂයේදී ලැබූ යටිතල පහසුකම් පිළිබඳ විස්තර..... 13

14. වෙනත් තොරතුරු..... 14

    14.1අධ්‍යාපනික ක්‍රියාකාරකම්..... 14

    14.2 ඇගයුම් සහ විභාග කටයුතු..... 27

    14.3 පුස්තකාලය..... 42

    14.4 සාමාන්‍ය පරිපාලනය..... 49

    14.5 මූල්‍ය..... 53

15. තිරසර සංවර්ධනය පිලිබඳව වාර්තාව..... 76

16. විශේෂ අවස්ථා - 2020..... 78

17. විගණන වාර්තාව සහ පිලිතුරු.....79

ඓතිහාසික පසුබිම

1870 වර්ෂයේ දී ලංකා වෛද්‍ය විද්‍යාලය ස්ථාපනය කිරීමත් සමඟ ශ්‍රී ලංකාව තුළ වෛද්‍ය අධ්‍යාපනය ආරම්භ වූ අතර 1942 දී ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් අනතුරුව එහි වෛද්‍ය පීඨය බවට පත්වන්නේ මෙම ලංකා වෛද්‍ය විද්‍යාලයයි . එම්.ඩී සහ එම්.ඕ.ජී උපාධි පිරිනැමීම සඳහා විභාග පැවැත්වීම ආරම්භවූ 1952 වර්ෂයද එම්.එස් උපාධිය පිරිනැමීම සඳහා විභාග පැවැත්වීම ආරම්භවූ 1953 වර්ෂයද වනතුරුම ලංකා විශ්වවිද්‍යාලය මගින් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ප්‍රදානය සඳහා විභාග පවත්වනු නොලැබිණ.

එවකට ලංකාව තුළ ව්‍යූහාත්මක හෝ සංවිධිතාත්මක පශ්චාත් උපාධි පුහුණුකිරීම් සිදු නොකෙරුණු අතර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි පුහුණුව ලබාගත හැකිවූයේ එක්සත් රාජධානියේ පැවැති වෛද්‍ය විද්‍යායතන මගිනි. ඒවායින් පිරිනමනු ලැබූ MRCP, FRCS, FFARCS, MRCOG, FRCR, MRCPath, MRCPsych සහ FDSRCS වැනි සුදුසුකම් විශේෂඥ වෛද්‍යවරුන් පත්කිරීමේදී සෞඛ්‍ය අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල මගින් පිළිගන්නා ලද සුදුසුකම් විය. මෙම විදේශ පුහුණුව වෙනුවට අධීක්ෂණය කරනු ලැබීමට යටත්ව තෙවසරක සේවාස්ථ පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව විභාගයක් පැවත්වියයුතු බව 1973 වසරේදී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි අධ්‍යාපනය පිළිබඳ උපදේශක කමිටුවක් මගින් රජයට නිර්දේශ ඉදිරිපත්කරනු ලැබීය. ඒ අනුව, 1972 අංක 1 දරන ලංකා විශ්ව විද්‍යාල පනතේ විධිවිධාන යටතේ 1976 වසරේ දී පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය (ෂජඨඑ) ස්ථාපනය කර කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ කරනු ලැබීය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්, වෛද්‍ය හැල්ෆ්ඩෑන් මාහ්ලර් විසින් 1976 මාර්තු 2 වන දින පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය (PGIM) නිල වශයෙන් ආරම්භකරනු ලැබූ අතර මහාචාර්ය කේ.එන්. සෙනෙවිරත්න මහතා එහි ප්‍රථම අධ්‍යක්ෂවරයා වශයෙන් පත්විය.

කෙසේ වුවද, එක්සත් රාජධානියේ විද්‍යායතන මගින් පවත්වනු ලැබූ විභාග කොළඹ දී පැවැත්වීම අඛණ්ඩව සිදුවීමත්, වෛද්‍ය වෘත්තිකයන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විභාගවලට පෙනීසිටීමට වඩා එක්සත් රාජධානියේ විභාගවලට පෙනී සිටීමට ප්‍රියමනාපභාවයක් දැක්වීම හේතුකොටගෙන අභිනවයෙන් පිහිටුවනු ලැබූ ආයතනයේ කටයුතු අඩාල විය. එබැවින්, මෙම ආයතනයේ ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම අවශ්‍ය විය. එක්සත් රාජධානියේ විද්‍යායතන මගින් ශ්‍රී ලංකාව තුළ විදේශීය පශ්චාත් උපාධි විභාග පැවැත්වීම 1980 ජනවාරි 1 වනදා සිට ක්‍රියාත්මකවන පරිදි නවතාලීමටත්, මෙම ආයතනය මගින් ලබාදෙන පශ්චාත් උපාධි සඳහා පූර්ණ පිළිගැනීමක් ලබා දීමට සහ වැඩි සැලකිල්ලක් දැක්වීමටත් රජය තීරණය කරන ලදී.

ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ අරමුණින් මෙම ආයතනය 1978 අංක 16 දරනවිශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ 1979 වසරේ දී නැවත ස්ථාපනය කර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය(PGIM) ලෙස නැවත නම්කරනු ලැබීය. වෛද්‍ය එස්.ඒ. කබ්රාල් මහතා එහි ප්‍රථම අධ්‍යක්ෂවරයා ලෙස පත්කරනු ලැබීය. ඒ අනුව, ඉහත සඳහන් කරන ලද විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ සම්පාදනය කරන ලද 1980 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥාපනත අංක 1 1980 අප්‍රේල් මස 10 වනදා සිට බලාත්මක විය. වෛද්‍ය විද්‍යාවේ විවිධ විශේෂඥතාවන් සඳහා අධ්‍යයන මණ්ඩල ප්‍රතිසංවිධානය කරනු ලැබූ අතර නිර්විත්දනවේදය, ප්‍රජා වෛද්‍යවිද්‍යාව, දන්ත ශල්‍යවේදය, පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය කර්මය,

වෛද්‍යවිද්‍යාව, නාරීවේදය හා ප්‍රසවවේදය, අක්ෂිවේදය, ව්‍යාධිවේදය, ළමාවිකිත්සාව, මනෝචිකිත්සාව, විකිරණවේදය සහ ශල්‍යවේදය වැනි විවිධ විශේෂඥතාවන් සඳහා පාඨමාලා හා විභාග සංවිධානය කරන ලදී. 1985 වසරේ දී තවත් අධ්‍යයන මණ්ඩල හතරක් එනම්, වෝහාරික වෛද්‍ය විද්‍යාව, වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව, කර්ණ නාසික ස්වරාලවේදය සහ සායනික අර්බුදවේදය ස්ථාපනයකරනු ලැබීය. මහාචාර්ය ආර්.පී. පානබොක්කේ මහතා 1990 වසරේ දී මෙම ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස පත්විය. වෛද්‍ය පරිපාලනය සහ චර්මවේදය පිළිබඳ අධ්‍යයන මණ්ඩල 1994 දී ද, මෛථුනවේදය පිළිබඳ අධ්‍යයන මණ්ඩල 2001 වසරේ ද ස්ථාපනය කරන ලදී. වෛද්‍ය ජේ.බී.පීරිස් මහතා 1995 වසරේ ද, මහාචාර්ය ලලිතා මෙන්ඩිස් මහත්මිය 2002 වසරේ ද, මහාචාර්ය රෙස්වි ෂෙරීෆ් මහතා 2006 වසරේ ද, මහාචාර්ය ජයන්ත ජයවර්ධන 2012 වසරේ ද, මහාචාර්ය එච්.ජානක ද සිල්වා මහතා 2014 වසරේ ද මෙම ආයතනයේ අධ්‍යක්ෂවරුන් ලෙස පත්වූහ.නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර 2011 වසරේ දී ස්ථාපනය කරන ලද අතර මහාචාර්ය ජයන්ත ජයවර්ධන, මහාචාර්ය ප්‍රශාන්ත විජේසිංහ, මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන සහ මහාචාර්ය සේනක රාජපක්ෂ මෙම ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර දැරූහ. 1980 ආඥාපනත සඳහා සිදුකරන ලද සංශෝධන 2014 ජූලි 1 වන දින සිට බලාත්මකවූ අතර සංශෝධිත ආඥාපනත යටතේ නව අධ්‍යයන මණ්ඩල කීපයක් සහ විවිධ විශේෂඥතාවන් සඳහා අධ්‍යයන මණ්ඩල කීපයක් ස්ථාපනය කරන ලදී.

අරමුණු

- ඉගැන්වීම්- ඉගෙනුම්, පුහුණු සහ පර්යේෂණයන්හි අඛණ්ඩ ඉහළ ස්ථාවරයන් සාක්ෂාත්කර ගැනීම.
- ජාතික සෞඛ්‍ය සේවා අවශ්‍යතාවන් සැපිරිය හැකි පරිදි පුහුණු වැඩසටහන් වැඩිදියුණු කිරීම.
- රටෙහි සෞඛ්‍ය සහ වෛද්‍ය අධ්‍යාපනික ප්‍රතිපත්තීන් විධිමත්ව සකස් කිරීම සඳහා දායක වීම.
- පශ්චාත් උපාධි වෛද්‍ය අධ්‍යාපනය සහ පර්යේෂණයන් සම්බන්ධයෙන් ආයතනයේ ක්‍රියාකාරිත්වය වඩා ව්‍යාප්ත සහ පුළුල් එකක් බවට පත්කිරීම.
- ආයතනයෙහි ඉහළ යන අධ්‍යාපනික අවශ්‍යතාවන් සැපිරිය හැකි වන පරිදි සහ එහි ගුණාත්මක භාවය තහවුරු වන පරිදි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

පරමාර්ථ

- දේශීය අවශ්‍යතාව සැපිරිය හැකි පරිදි ඉහළ මට්ටමේ ගුණාත්මක භාවයකින් සමන්විත සෞඛ්‍ය සේවාවක් සඳහා ප්‍රමාණවත් මිනිස් සම්පතක් බිහි කිරීම.
- නිරන්තර ඉගෙනුම තුලින් සෞඛ්‍ය වෘත්තීකයින්ගේ කුසලතා සහ නිපුණතාවන් පවත්වාගෙන යාම සහ වැඩිදියුණු කිරීම.
- සෞඛ්‍ය වෘත්තිකයින් හට නිරන්තර අධ්‍යයනයන් සඳහා ඉඩ පහසුකම් සලසන ක්‍රමවේදයන් ඇතිකිරීම.
- වෛද්‍ය වෘත්තීකයින් තුළ සඵලදායක ආකල්ප සහ ස්වයං ඉගෙනුම් ප්‍රවර්ධනය කිරීම.
- පශ්චාත් උපාධි අධ්‍යයනයන්ට අදාළව පවතින සම්පත් සහ සුදුසු තාක්ෂණයන් භාවිතා කිරීම දිරිගැන්වීම.
- සෞඛ්‍ය ගැටළු විසඳීමේදී සෞඛ්‍ය සේවා කණ්ඩායම් ප්‍රවේශය භාවිතා කිරීම පිළිබඳ සංකල්පය හඳුන්වාදීම.
- දුර්වලතා සහ වැඩිදියුණු කරගතයුතු අංශ පිළිබඳව තොරතුරු රැස්කරගැනීම සඳහා වෛද්‍ය අධ්‍යාපනික වැඩසටහන් ඇගයීමට ලක් කිරීම.
- නිවාරක සහ ප්‍රතිකාරක සත්කාරයන් මෙන්ම හෙද සත්කාරයන්ද මනා ලෙස අනුකලනය වූ සේවාස්ථ වැඩසටහන් සංවිධානය කිරීම.
- ශ්‍රී ලංකාව තුළ පශ්චාත් උපාධි මට්ටමේ වෛද්‍ය අධ්‍යාපනය ඉහළ මට්ටමකින් පවත්වාගැනීම සඳහා විදේශීය අධ්‍යාපනික ආයතන සමග අනෙකොන්‍ය ගුහසිද්ධිය සැලසෙන ආකාරයෙන් අධ්‍යාපනික සබඳතාවන් වැඩිදියුණු කරගැනීම. රටෙහි සෞඛ්‍ය සේවා අවශ්‍යතාවන් සැපිරීම මෙන්ම කලාපය සහ ලොව පුරා වෛද්‍ය විද්‍යාවේ විවිධ ක්ෂේත්‍රයනට ක්‍රියාකාරී දායකත්වයක් සපයන්නාවූ විශේෂඥ වෘත්තීකයන් බිහිකරන්නාවූද මූල්‍යමය සහ පරිපාලනමය වශයෙන් ස්වාධීනව ක්‍රියාත්මකවන ජාත්‍යන්තරව පිළිගැනීමක් සහිත විශිෂ්ට ආයතනයක් බවට පත්වීම.

1. කළමනාකරණ මණ්ඩලය

කළමනාකරණ මණ්ඩලය ප්‍රධාන විධායක කමිටුව මෙන්ම පරිපාලන අධිකාරියද වෙයි.

මහාචාර්ය සේනක රාජපක්ෂ. අධ්‍යක්ෂක, පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය

මහාචාර්ය එස්.සිවගනේෂ්. නියෝජ්‍ය අධ්‍යක්ෂක, පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය

මහාචාර්ය එස්.ඩී ජයරත්න **(සභාපති)** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික

එම්.එම්.පී.කේ. මායාදුන්නේ මයා, ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

වසන්තා පෙරේරා මිය, ලේකම්/සෞඛ්‍ය

ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මයා, මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් නම්කල නියෝජිත

වෛද්‍යාචාර්ය අනිල් ජාසිංහ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

මහාචාර්ය ජෙනිෆර් පෙරේරා. කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත

මහාචාර්ය එස්.ඩී. ධර්මරත්න පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත

මහාචාර්ය වසන්ත දේවසිරි රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත

වෛද්‍යාචාර්ය එස්. රවිරාජ්, යාපනය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත

මහාචාර්ය එස්.ජී. යසවර්ධන, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත

මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන, කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත

වෛද්‍යාචාර්ය ඒ.එන්. අරුල්ප්‍රකාශම් නැගෙනහිර විශ්ව විද්‍යාලයේ සෞඛ්‍ය උපස්ථාන වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත

මහාචාර්ය එස්.එච්. සිරිබද්ධන, රජරට විශ්ව විද්‍යාලයේ වෛද්‍ය සහ අනුබද්ධ විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත

මහාචාර්ය ඒ.එම්. අට්ටිගල්ල, පේරාදෙණිය විශ්ව, විද්‍යාලයේ දන්ත වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත

මහාචාර්ය ජයන්ත ජයවර්ධන. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික

මහාචාර්ය නන්දදේව සමරසේකර. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික

මහාචාර්ය රන්ජනී ගමගේ (මිය) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික

වෛද්‍යාචාර්ය හර්ෂ කබ්රාල්. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික

මහාචාර්ය ශ්‍රීනාත් චන්ද්‍රසේකර. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික

වෛද්‍යාචාර්ය මහානාම ගුණසේකර. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික

මහාචාර්ය ලක්ෂ්මන් රත්නායක සභාව මගින් නම්කල නියෝජිත

ජේ.එම්. ස්වාමිනාදන් මයා, සභාව මගින් නම්කල නියෝජිත

වෛද්‍යාචාර්ය චන්දන ගජනායක, වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (දන්ත වෛද්‍ය සේවා)

වෛද්‍යාචාර්ය සුදත් සමරවීර, වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන, පුහුණු සහ පර්යේෂණ)

මහාචාර්ය වී.පී.වික්‍රමසිංහ, පීඨ නියෝජිත/ වෛද්‍ය විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

මහාචාර්ය එම්.වී.පී පින්ටෝ, පීඨ නියෝජිත/ වෛද්‍ය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය කේ. මුහුන්දන්, පීඨ නියෝජිත/ වෛද්‍ය විද්‍යා පීඨය, යාපනය විශ්ව විද්‍යාලය

මහාචාර්ය දීපක වීරසේකර, පීඨ නියෝජිත/ වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

මහාචාර්ය ඒ.පී. ද සිල්වා පීඨ නියෝජිත/ වෛද්‍ය විද්‍යා පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය ඩබ්.එම්.පී.එස්.කේ. විජේකෝන්, පීඨ නියෝජිත/ දන්ත වෛද්‍ය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය එම්. තිරුකුමාර්, පීඨ නියෝජිත/ සෞඛ්‍ය සේවා විද්‍යා පීඨය, නැගෙනහිර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

ආර්.එස්.පී.බී.තලගස්පිටිය මයා, පීඨ නියෝජිත/වෛද්‍ය සහ අනුබද්ධ විද්‍යා පීඨය, රජරට විශ්ව විද්‍යාලය,ශ්‍රී ලංකාව

2. සම්පත් හා සිසුන් පිළිබඳව විස්තර

පාඨමාලාව	පුහුණු ලාභීන් සංඛ්‍යාව	සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය
පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලා	15	*
පශ්චාත් උපාධි ඩිප්ලෝමා	547	*
එම්. එස්. සී	210	*
පූර්ව එම්.ඩී සහ එම්. ඩී I කොටස	1610	*
පශ්චාත් එම්.ඩී (දේශීය)	914	*
එම්.ඩී (විදේශීය)	559	*
එකතුව	**3855**	

*ක්ෂේත්‍ර විශේෂඥයින්ගේ සේවය බාහිර කථිකාචාර්යවරුන් ලෙස ලබාගනු ලැබේ

3. දේශීය සිසුන් පිළිබඳව විස්තර

පාඨමාලාව	2020 කාණ්ඩය	පළමු වසර	දෙවන වසර	තෙවන වසර	සිවුවන වසර	පස්වන වසර	හයවැනි වසර	එකතුව
සහතික පත්‍ර	15	15						15
පශ්චාත් උපාධි ඩිප්ලෝමා	319	492	55					547
එම්. එස්.සී.	145	145	65					210
සේවාස්ථ/1 කොටස	39	41	22					63
පූර්ව එම්.ඩී. සහ පශ්චාත් එම්.ඩී (දේශීය)	468	447	475	625	662	229	23	2461
එතෙර පුහුණු සඳහා ගොස් පැමිණි					165	312	82	559
එකතුව	**986**	**1140**	**617**	**625**	**827**	**541**	**105**	**3885**

4. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

පීඨය/ශාඛාව	විෂයය/විෂය ක්ෂේත්‍රය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	සහකාර කථිකාචාර්ය	උපදේශක	වෙනත්	ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	අධ්‍යක්ෂ	01							
	නියෝජ්‍ය අධ්‍යක්ෂ		01						
වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය	සායනික විද්‍යා			01					

පීඨය/ශාඛාව	විෂයය/විෂය ක්ෂේත්‍රය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	සහකාර කථිකාචාර්ය	උපදේශක	වෙනත්	ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලෙයි පති
වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය	රසායනාගාර විද්‍යා			01					
	වෛද්‍ය අධ්‍යාපනය			01	02				
	ජේව වෛද්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව විශේෂ අවධානයක් සහිත වෛද්‍ය අධ්‍යාපනය		01						
	තාවකාලික පර්යේෂණ සහකාර							02	
පුස්තකාලය									02

5. අනධ්‍යයන මණ්ඩලය පිළිබඳව තොරතුරු

පීඨය/ශාඛාව	පරිපාලන	අධ්‍යයන සහාය	තාක්ෂණික කාර්ය මණ්ඩලය	ලිපිකරු සහ සමාන්තර	සුළු සේවක
අධ්‍යක්ෂක කාර්යාලය		-	-	01	01
අතිරේක රෙජිස්ට්‍රාර් කාර්යාලය	01	-	-	01	-
සාමාන්‍ය පරිපාලන	01	-	01	06	09
පරිගණක ඒකකය	-	02	03	01	-
වෛද්‍ය නිදර්ශන ඒකකය	-	-	02	-	-
වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය	-	01	-	01	01
මූල්‍ය	02	-	-	09	02
විභාග	03	-	-	20	03
අධ්‍යයන	02	-	-	13	04
පුස්තකාලය	-	-	-	07	05

6. පර්යේෂණ නව සොයාගැනීම් සහ ප්‍රකාශන පිළිබඳව විස්තර

විෂයය	භාරදීම්
පර්යේෂණ සංඛ්‍යාව (මේ වනවිට සිදුකරමින් පවතින)	10
උපාධි නිබන්ධන සහ විද්වත් රචනා සංඛ්‍යාව	-
ලිපි සහ පත්‍රිකා සංඛ්‍යාව	11
එකතුව	**21**

7. ආරම්භ කරන ලද නව පාඨමාලාවන් පිළිබඳව විස්තර

පහත සඳහන් නව පුහුණු වැඩසටහන් සඳහා උපාධි ප්‍රකාශපත්‍ර සැකසීමට කටයුතු යොදන ලදී.

- පර්යේෂණාගාර අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී. උපාධිය සහ මණ්ඩළ සහතිකකරණය (කවුන්සිල අනුමැතිය අපේක්ෂිතය)

පවතින වැඩසටහන්හි පහත සඳහන් විශය මාලාවන් සහ උපාධි ප්‍රකාශපත්‍ර මෙම වසර තුළදී සංශෝධනය කරන ලදී.

- අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය (පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ශාස්ත්‍රපති උපාධියක් දක්වා ඉහළ දමන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමැතිය 2020 ඔක්තෝබර් මස 22 වන දින ලබාගන්නා ලදී)
- සායනික ඖෂධ විද්‍යාව සහ චිකිත්සනය පිළිබඳව මණ්ඩළ සහතිකකරණය
- සායනික ඖෂධ විද්‍යාව සහ චිකිත්සනය පිළිබඳව එම්.එස්.සී. වැඩසටහන
- පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩළ සහතිකකරණය
- සන්ධිප්‍රදාහය සහ පුනරුත්ථාපනය පිළිබඳව මණ්ඩළ සහතිකකරණය

පහත වැඩසටහන් මේ වනවිටත් සංශෝධනය කරමින් පවතී

- ව්‍යවච්ඡේද විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- භෞතවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- සාමාන්‍ය දන්ත පිලිවෙත පිළිබඳව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

- අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය (පවතින පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ එම්.එස්.සී. උපාධිය වෙනුවට අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය හාවිතා වනු ඇත.)
- සායනික පිළිකාවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩළ සහතිකකරණය
- වෛද්‍ය ක්ෂුද්‍ර ජීවවිද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩළ සහතිකකරණය
- හදිසි අවස්ථා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩළ සහතිකකරණය
- නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩළ සහතිකකරණය
- වෛරසවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩළ සහතිකකරණය
- මුඛ හා හනුවක්ත්‍ර ව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩළ සහතිකකරණය (මෙහි නාමකරණය මුඛ ව්‍යාධිවේදය පිලිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩළ සහතිකකරණයේ සිට මුඛ හා හනුවක්ත්‍ර ව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩළ සහතිකකරණය ලෙඝ වෙනස් වී ඇත.)

- හෘත් විද්‍යුත් භෞතවේදය පිලිබඳව මණ්ඩළ සහතිකකරණය
- Imaging Cardiology (හෘත්වේද මූර්තනය) පිලිබඳව මණ්ඩළ සහතිකකරණය

- ස්නායුවේදය පිලිබඳව මණ්ඩළ සහතිකකරණය

නව පුහුණු වැඩසටහන්

- සායනික සංචාරක වෛද්‍ය විද්‍යාව (Clinical Travel Medicine) පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය
- වෝහාරික දන්තවිද්‍යාව පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය

8. පුනරාවර්තන වියදම් පිළිබඳව විස්තර

විෂයය	2019 රුපියල්	2020 රුපියල්
පුද්ගල පඩිනඩි	172,528,453	176,356,989
ගමන් වියදම්	10,258,888	12,337,419
සැපයුම්	14,659,009	11,252,775
නඩත්තු වියදම්	7,726,525	4,159,592
ගිවිසුම්ගත සේවාවන්	42,189,957	46,739,056
වෙනත් පුනරාවර්තන වියදම්	108,992,510	80,251,606
පශ්චාත් උපාධි පුහුණු වියදම්	26,246,946	28,436,609
එකතුව	**382,602,287**	**359,534,046**

9. ප්‍රාග්ධන වියදම් පිළිබඳව විස්තර

විෂයය	2019 රුපියල්	2020 රුපියල්
ගෘහභාණ්ඩ සහ උපකරණ අත්පත් කර ගැනීම	81,117,337	36,375,451
විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ අත්කර ගැනීම	1,383,184	1,005,100
ග්‍රන්ථ සහ වාර සඟරා අත්පත් කර ගැනීම	2,667,333	-
ගොඩනැගිලි සඳහා එකතු කිරීම්	1,610,920,457	10,257,208
වෙනත් (උපාධි ලෝගු)	-	495,000
වෙනත් (අස්පෘශ්‍ය වත්කම්)	12,753,437	14,553,567
වෙනත් (විදුලි බෙදාහැරීම)	-	-
එකතුව	**1,708,841,747**	**62, 686,327**

10. මූල්‍ය ප්‍රගතිය පිළිබඳව විස්තර (වියදම්)

විෂයය		රජයේ ප්‍රධානයන් 2020	උත්පාදිත ආදායම 2020	වියදම 2020
පුනරාවර්තන වියදම් ව්‍යාපෘතිය		133,000,000	226,534,046	359,534,046
ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘතිය	- අත්පත් කරගත් වත්කම්	3,500,000	59,123,855	62,686,327
	- රොඩ්නි වීදියේ ගොඩනැගිල්ල Rentention	81,500,000	-	40,608,186
එකතුව		**218,000,000**	**285,657,901**	**462,828,558**

11. මූල්‍ය ප්‍රගතිය පිළිබඳව විස්තර (උත්පාදිත ආදායම)

ආදායම් මූලාශ්‍රය	2020 ප්‍රතිපාදන රුපියල්	2020 එකතු වූ මුදල රුපියල්	හිඟය/අතිරික්තය රුපියල්
පශ්චාත් උපාධි අධ්‍යයන	312,978,000	301,245,341	(11,732,660)
වෙනත්	27,241,000	64,270,084	37,029,084
එකතුව	**340,219,000**	**365,515,424**	

12. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය 2020

විෂයය	සූත්‍රය	සිසුවකු සඳහා වූ වියදම (රුපියල්)
එක් සිසුවකු/ සිසුවියක සඳහා වූ පුනරාවර්තන වියදම (RE)	පුනරාවර්තන වියදම - සිසුන්/සිසුවියන් සංඛ්‍යාව	92,326.81
එක් සිසුවකු/සිසුවියක සඳහා වූ ප්‍රාග්ධන වියදම (CE)	පුනරාවර්තන වියදම - සිසුන්/සිසුවියන් සංඛ්‍යාව	120,098.22
එකතුව		**212,425.03**

13. 2020 වසරේදී ලැබූ යටිතල පහසුකම් පිළිබඳ විස්තර

යටිතල පහසුකම් විස්තර	වියදම රුපියල්	කාර්ය ප්‍රගතිය
1. ප්‍රධාන පරිශ්‍රය - තෙවැනි මහලේ විභාග ශාලාව වෙනස් කිරීමේ යෝජිත ව්‍යාපෘතිය	276,602.00	සම්පූර්ණ කර ඇත
2. අධ්‍යයන මධ්‍යස්ථානය - අධ්‍යාපකවරුන්ගේ කාමර සඳහා සෘජු සබඳතා සහ අභ්‍යන්තර දුරකථන සබඳතා සඳහා දුරකථන කේබල් යෙදීම.	98,500.00	සම්පූර්ණ කර ඇත
3. ප්‍රධාන පරිශ්‍රය- විභාග අංශයේ ලේඛණාගාරය සඳහා තව් සහිත කොන් රාක්ක (slotted angle racks) තැනීම	539,735.19	සම්පූර්ණ කර ඇත
4. PGIM ප්‍රධාන පරිශ්‍රයේ ආරක්ෂක නිලධාරී කුටිය ඉදිකිරීම සඳහා වියදම	398,085.00	සම්පූර්ණ කර ඇත
5. PGIM ප්‍රධාන පරිශ්‍රයේ පළමු මහලේ පුස්තකාලය විභාග ශාලාවක් ලෙස වෙනස් කිරීම	433,330.00	සම්පූර්ණ කර ඇත
6. PGIM ප්‍රධාන පරිශ්‍රයේ පිහිටි කොට්ටම්බා ගස් දෙකක සහ කොස් ගස් දෙකක අතු කපා ඉවත් කිරීම (ශාක සුන්බුන් ඉවත් කිරීමේ සේවාව සමග)	95,580.00	සම්පූර්ණ කර ඇත
7. PGIM හි අධ්‍යයන මධ්‍යස්ථානයෙහි ආරක්ෂක කුටිය පුළුල් කිරීම.	707,427.20	සම්පූර්ණ කර ඇත
8. පළමුවන මහලේ ලොබි කාමරය ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ විවේක කාමරය ලෙෂ වෙනස් කිරීම - ප්‍රධාන පරිශ්‍රය	76,950.00	සම්පූර්ණ කර ඇත
එකතුව	**2,626,209.39**	

14. වෙනත් තොරතුරු

14.1 ආයතනික ක්‍රියාකාරකම්

14.1.1. ලියාපදිංචි කිරීම්

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2020 වසර තුළ අධ්‍යයන මණ්ඩල 23 ක සහ විශේෂඥ මණ්ඩල 33 ක සහ අන්තර් විශේෂඥ මණ්ඩළ 4 ක සෘජු අධීක්ෂණය යටතේ එම්.ඩී, මණ්ඩළ සහතිකකරණ, ශාස්ත්‍රපති, පී.ජී ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර යන ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි පාඨමාලාවන් 135 ක් පවත්වනු ලැබිනි.

එම්.ඩී.උපාධි , මණ්ඩළ සහතිකකරණ, ශාස්ත්‍රපති, පී.ජී ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර යන ක්ෂේත්‍රයන්හි උපාධි පාඨමාලාවන් සඳහා පුහුණු වැඩසටහන් සඳහා නවක සිසුන් *986* ක් ඇතුලත් සමස්තයක් ලෙස 3876ක් වූ පශ්චාත් උපාධි පුහුණුලාභීන් සංඛ්‍යාවක් බඳවා ගනු ලැබිනි. ඔවුන් අතරින් පුහුණුලාභීන් *3428* දෙනෙකු දේශීය වශයෙන් පුහුණුව ලබන අතර *448* දෙනෙකු විදේශයන්හි වන පිළිගත් පුහුණු මධ්‍යස්ථානයන්හි පුහුණුව ලබති.

14.1.2. අධ්‍යයන අවධාරණය

2020 වසරේ අධ්‍යයන අවධාරණය කේන්ද්‍රගත වූයේ නව පුහුණු වැඩසටහන් හඳුන්වාදීම , ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විෂය මාලාවන් සමග ප්‍රමිතිගත වෙමින් සහ නව ශිල්පක්‍රම අන්තර්ග්‍රහණය කරගනිමින් පවතින පුහුණු වැඩ සටහන් සහ උපාධි ප්‍රකාශ පත්‍ර ප්‍රතිශෝධනය කරගැනීම මගින් ඒවායේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම කෙරෙහිය.

මෙම වසරේදීද එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව, ඉන්දියාව, එක්සත් ඇමෙරිකා රාජධානිය, පකිස්ථානය සහ ටර්කිය යන රටවල පිහිටි විශිෂ්ට මධ්‍යස්ථානයන්හි සිදුකරන එම්.ඩී. උපාධි පරීක්ෂණවල බාහිර විභාග පරීක්ෂකයන්ගේ වාර්තාවන්හි සඳහන් නිර්දේශ පදනම් කරගෙන පුහුණුකරුවන් සහ විභාග පිළිතුරුපත්‍ර පරීක්ෂකයන් නව ශිල්පක්‍රම වලින් සන්නද්ධ කිරීමට මෙන්ම විභාග ආකෘතිපත්‍ර වල තත්ත්වය ඉහළ නැංවීම සහ පුහුණු වැඩසටහන්වල සහ විභාගවල පිළිගතහැකි ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ඔවුනට උචිත මාතෘකා ඔස්සේ වැඩමුළු මාලාවක් පවත්වන ලදී.

14.1.3. පශ්චාත් උපාධි පුහුණුලාභීන් සඳහා සාමාන්‍ය රෙගුලාසි සහ මාර්ගෝපදේශ

2019 වසරේදී ප්‍රකාශයට පත් කරන ලද පශ්චාත් උපාධි පුහුණුලාභීන් සඳහා සාමාන්‍ය රෙගුලාසි සහ මාර්ගෝපදේශ පිළිබඳව වූ ලේඛණය 2020 වසරේ ජනවාරි මස සිට ක්‍රියාත්මක කළ හැකිවන පරිදි 2019 වසර තුළදී කළමනාකරණ මණ්ඩලය/සෙනේට් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ අන්තර්ගත කරගනිමින් සංශෝධනය කරනු ලැබිනි.

14.1.4. පුහුණුකරුවන් විභාග පරීක්ෂකවරුන් සහ අධීක්ෂකවරුන් සඳහා පොදු රෙගුලාසි සහ මාර්ගෝපදේශ

පුහුණුකරුවන් විභාග පරීක්ෂකවරුන් සහ අධීක්ෂකවරුන් සඳහා පොදු රෙගුලාසි සහ මාර්ගෝපදේශ පිළිබඳව වන 2019 දී ප්‍රකාශයට පත් කරන ලද ලියවිල්ල කළමනාකරණ මණ්ඩලය සහ සනාථන සභාව විසින් ගනු ලැබූ තීරණ අන්තර්ග්‍රහණය කරගනිමින් 2019 වසරේ සංශෝධනය කරන ලද්දේ 2020 ජනවාරි මස සිට බලාත්මක කිරීම සඳහාය.

වගුව - 1

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2020 වසර තුළදී ක්‍රියාත්මක කරනු ලැබූ අධ්‍යයන වැඩසටහන්

	වැඩසටහන
පශ්චාත් උපාධි සහතිකපත්‍ර	වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳවපශ්චාත් උපාධි සහතික පත්‍රය
පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන්	ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	වෛද්‍ය ධූලකවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (මාර්ගගත)
	වයෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	වෛද්‍ය ක්ෂුද්‍රජෛවවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	කායව්‍යවච්ඡේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	වෛද්‍ය විද්‍යා භෞතවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	රෝහල් දන්ත පිළිවෙත පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	සෞඛ්‍ය ආංශික ආපදා කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	මෛථුනවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	වේදනා නාශක වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	උග්‍රාවස්ථා උපස්ථාන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	මනෝ චිකිත්සාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	ක්ෂය රෝගය සහ ළය රෝග පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	ළමා සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	සායනික රක්තවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

විශේෂවේදී වැඩසටහන්	වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව විශේෂවේදී උපාධිය
	වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව විශේෂවේදී උපාධිය
	හමුදා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී. උපාධිය
	සායනික ඖෂධ විද්‍යාව සහ චිකිත්සනය පිළිබඳව එම්.එස්.සී. උපාධිය
	ජෛව වෛද්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්. එස්. සී. උපාධිය
	වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්. එස්. සී. උපාධිය
	ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. එස්. සී. උපාධිය
	ප්‍රජා දන්ත චිකිත්සාව පිළිබඳව එම්.එස්.සී. උපාධිය
	වෛද්‍ය ධූලකවේදය පිළිබඳව එම්.එස්.සී. උපාධිය (මාර්ගගත)
	මානව පෝෂණය පිළිබඳව එම්. එස්.සී. උපාධිය
	අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. එස්.සී. උපාධිය
එම් ඩී උපාධි සහ මණ්ඩළ සහතිකකරණයන්	නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	හෘත් උරස්ථ නිර්වින්දනවේදය පිළිබඳව විශේෂ පුහුණුවක් සහිතව නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	ස්නායුවේද නිර්වින්දනවේදය පිළිබඳව විශේෂ පුහුණුවක් සහිතව නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	ප්‍රසවවේද නිර්වින්දනවේදය පිළිබඳව විශේෂ පුහුණුවක් සහිතව නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	ළමා චිකිත්සක නිර්වින්දනවේදය පිළිබඳව විශේෂ පුහුණුවක් සහිතව නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	දැඩි සත්කාර පිළිබඳව විශේෂ පුහුණුවක් සහිතව නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වේදනා කළමනාකරණය පිළිබඳව විශේෂ පුහුණුවක් සහිතව නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	ඉන්ද්‍රිය බද්ධ කිරීම් සහ උග්‍රාවස්ථා උපස්ථානය පිළිබඳව විශේෂ පුහුණුවක් සහිතව නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	නිර්වින්දනවේද/ වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය සහ උග්‍රාවස්ථා උපස්ථාන වෛද්‍ය විද්‍යාව පිළිබඳව මණ්ඩළ සහතිකකරණය
	ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	ප්‍රජා දන්ත චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	සායනික අර්බුදවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ ළමා චිකිත්සක අර්බුදවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	සායනික අර්බුදවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ රක්තවේද අර්බුදවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	මුඛ හා හනුවක්ත්‍ර ශල්‍ය චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	විකලාංග දන්ත චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	පුනර්ජීවන දන්ත චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	මුඛ ව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	චර්මවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය (උපාධි නිබන්ධනය මගින්)

	පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය (සායනික පූහුණුව මගින්)
	අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	සායනික වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව විශේෂ අවධානයක් යොදවමින් වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වෝහාරික ධූලකවේදය පිළිබඳව විශේෂ අවධානයක් යොදවමින් වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වෝහාරික ළමා චිකිත්සක සහ නවජන්මවේදී ව්‍යාධිවේදය පිළිබඳව විශේෂ අවධානයක් යොදවමින් වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වෝහාරික පටක ව්‍යාධිවේදය පිළිබඳව විශේෂ අවධානයක් යොදවමින් වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වෝහාරික මානව විද්‍යාව පිළිබඳව විශේෂ අවධානයක් යොදවමින් වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වෝහාරික විකිරණවේදය පිළිබඳව විශේෂ අවධානයක් යොදවමින් වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	සාමාන්‍ය වෛද්‍යවිද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වයෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ වැඩිහිටි හෘත් වේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ හෘත් විද්‍යුත භෞතවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ අන්තෝසර්ගවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ ඡථර අන්ත්‍ර විද්‍යාව පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ වෘක්කවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ ස්නායුවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ සායනික ස්නායු භෞතවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ ශ්වසන වෛද්‍ය විද්‍යාව පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ සන්ධිප්‍රදාහය සහ පුනරුත්ථාපනය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ පුනරුත්ථාපන වෛද්‍ය විද්‍යාව පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ සායනික ඖෂධවේදය සහ භෞත චිකිත්සනය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය ක්ෂුද්‍රජෛවවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය පරපෝෂවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය වයිරසවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	හදිසි අවස්ථා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය

	වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම්.ඩී. වැඩසටහන සහ මණ්ඩල සහතිකකරණය
	සෞඛ්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්.ඩී. වැඩසටහන සහ මණ්ඩල සහතිකකරණය
	සායනික පෝෂණය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	නාරීවේදය හා ප්‍රසවවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	නාරීවේදය හා ප්‍රසවවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ නාරී අර්බුදවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	නාරීවේදය හා ප්‍රසවවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ ඌණ දරුඵල චිකිත්සාව පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	නාරීවේදය හා ප්‍රසවවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මෛත්‍ර ප්‍රසවවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	නාරීවේදය හා ප්‍රසවවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ භ්‍රෑණ වෛද්‍ය විද්‍යාව පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	අක්ෂිවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	අක්ෂිවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ දෘෂ්ටිපටල ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	අක්ෂිවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ ළමා චිකිත්සා අක්ෂිවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	අක්ෂිවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ කෝර්ණියාව සහ බාහිර අක්ෂි රෝග පිළිබඳව විශේෂ පුහුණුවක් සහිත සාමාන්‍ය අක්ෂිවේදය පිළිබඳ මණ්ඩල සහතිකකරණය
	අක්ෂිවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ කක්ෂි සහ අක්ෂි පිරිසැකසුම පිළිබඳව විශේෂ පුහුණුවක් සහිත සාමාන්‍ය අක්ෂිවේදය පිළිබඳ මණ්ඩල සහතිකකරණය
	කර්ණනාසික ස්වරාලවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	ළමා චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	ළමා චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ ළමා චිකිත්සා නව්‍යසූතිවේදය සහ පරිසූතික වෛද්‍යවිද්‍යාව පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ළමා චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ ළමා චිකිත්සා හෘත්වේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ළමා චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ ළමා චිකිත්සා වෘක්කවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ළමා චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ ළමා චිකිත්සා ස්නායුවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ළමා චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ ළමා චිකිත්සා දැඩි සත්කාරය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ළමා චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ ළමා චිකිත්සා අන්තරාසර්ගවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ළමා චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ ළමා චිකිත්සාව සහ පෙනහළු ආශ්‍රිත රෝග පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ළමා චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ ප්‍රජා ළමා චිකිත්සාව පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ළමා චිකිත්සාව/ වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ සායනික ජාන විද්‍යාව පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	පටක ව්‍යාධිවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	රසායනික ව්‍යාධිවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	සායනික රක්තවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	මනෝ චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	මනෝ චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ වෝහාරික මනෝ විද්‍යාව පිළිබඳව මණ්ඩල සහතිකකරණය

	මනෝ චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ ළමා හා නවයෞවන මනෝ චිකිත්සාව පිලිබඳව මණ්ඩල සහතිකකරණය
	මනෝ චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ වයෝවෘද්ධ මනෝ චිකිත්සාව පිලිබඳව මණ්ඩල සහතිකකරණය
	මනෝ චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ ඇබ්බැහිවීම් පිළිබඳව මනෝ චිකිත්සාව පිලිබඳව මණ්ඩල සහතිකකරණය
	සාමාන්‍ය විකිරණවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	විකිරණවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ ළමාචිකිත්සා විකිරණවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	විකිරණවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ ස්නායු විකිරණවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	විකිරණවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ අතරමැදි විකිරණවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ක්‍රීඩා සහ ව්‍යායාම් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම් ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ ඉහළ ආමාශයික අන්ත්‍ර ශල්‍යවේදය පිළිබඳව විශේෂ අවධානයක් ඇතිව සාමාන්‍ය ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ Hepato-pancreato-biliary surgery පිළිබඳව විශේෂ අවධානයක් ඇතිව සාමාන්‍ය ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ පහළ ආමාශයික අන්ත්‍ර ශල්‍යවේදය පිළිබඳව විශේෂ අවධානයක් ඇතිව සාමාන්‍ය ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ වාහිණී ශල්‍යවේදය පිළිබඳව විශේෂ අවධානයක් ඇතිව සාමාන්‍ය ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ ළය ශල්‍යවේදය පිළිබඳව විශේෂ අවධානයක් ඇතිව සාමාන්‍ය ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ අන්තරාසර්ග ශල්‍යවේදය පිළිබඳව විශේෂ අවධානයක් ඇතිව සාමාන්‍ය ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ ක්ෂති ශල්‍යවේදය පිළිබඳව විශේෂ අවධානයක් ඇතිව සාමාන්‍ය ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ ශල්‍ය අර්බුදවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ හෘත් උරස්ථ ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ ආමාශයික අන්ත්‍ර ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ ළමා චිකිත්සක ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ ප්ලාස්ටික් ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ මෞත්‍ර ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය

	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ වාහිණී ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ ස්නායු ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ උරස්ථ ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	විකලාංග ශෛල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	මෙථුනවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය

වගු අංක 02

2020.12.31 වනවිට එක් එක් අධ්‍යයන වැඩසටහන්හි විවිධ අදියරයන්හි වන සමස්ත පුහුණුලාභීන් සංඛ්‍යාව

අධ්‍යයන වැඩසටහන	නව ලියාපදිංචිවීම	සේවාස්ථ/ සහතිකපත්‍ර I කොටස	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	එම්. එස්.සී	පූර්ව එම්.ඩී	පශ්චාත් එම්.ඩී. (දේශීය)	විදේශ		2020		එකතුව (1-6)
							වසර 2ක් දක්වා	තෙවන වසර	ආපසු පැමිණි /මණ්ඩල සහතිකකරණය ලද	ආපසු පැමිණි /මණ්ඩල සහතිකකරණය ලැබීමට නියමිත	
							(අ)	(ආ)	(ඇ)	(ඈ)	
		1		2	3	4	5		6		
වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව සහතිකපත්‍රය	15	15									15
කායව්‍යවච්ඡේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව			11								11
උග්‍රාවස්ථා උපස්ථාන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	17		41								41
ළමා සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	70		70								70
පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	37		83								83
වයෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	13		28								28
සෞඛ්‍ය ආංශික ආපදා කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	15		32								32
රෝහල් දන්ත පිළිවෙත පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	33		33								33
(ව්‍යාධිවේදය) සායනික රක්තවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	10		29								29
වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	12		25								25
අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව		2020 වසර තුළ නවක බඳවාගැනීම් නොමැත									
වේදනා නාශක වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	6		19								19
භෞතවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව											0
මනෝ චිකිත්සාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	10		10								10
ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව		2020 වසර තුළ නවක බඳවාගැනීම් නොමැත									
ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	15		15								15
ක්ෂය රෝගය සහ ළය රෝග පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	67		117								117
පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	8		16								16
මෙථුනවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	6		18								18
ජෛව වෛද්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව	26			69							69

එම්.එස්.සී. උපාධිය											
ප්‍රජා දන්ත චිකිත්සාව පිළිබඳව එම්.එස්.සී. උපාධිය	3			3							3
ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී. උපාධිය	44			44							44
සායනික ඖෂධවේදය සහ භෞත චිකිත්සනය පිළිබඳව එම්. එස්. සී. උපාධිය	2020 වසර තුළ නවක බඳවාගැනීම් නොමැත										
මානව පෝෂණය පිළිබඳව එම්. එස්.සී. උපාධිය	38			38							38
වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්. එස්.සී. උපාධිය	25			25							25
අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. එස්.සී. උපාධිය				2							2
වෛද්‍ය ධූලක වේදය පිළිබඳව එම්. එස්.සී. උපාධිය				20							20
හමුදා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. එස්.සී. උපාධිය	9			9							9
සේවාස්ථ සායනික අර්බුදවේදය	5	7									7
රසායනික ව්‍යාධිවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය 1 කොටස	8	16									16
පටක ව්‍යාධිවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය 1 කොටස	14	28									28
වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්. ඩී. උපාධිය 1 කොටස		2020 වසර තුළ නවක බඳවාගැනීම් නොමැත									
අක්ෂිවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය 1 කොටස	12	12									12
නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය	19				88	83	50		5	11	237
රසායනික ව්‍යාධිවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	12				19	3	4			1	27
සායනික අර්බුදවේදය පිළිබඳව එම්.ඩී. උපාධිය	5				13	11	8		1		33
සායනික පෝෂණය පිළිබඳව එම්. ඩී. උපාධිය	21				37	24					61
ප්‍රජා දන්ත චිකිත්සාව පිළිබඳව එම්. ඩී. උපාධිය					9	4			1		14
ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය	20				64	21	12		3	4	104
චර්මවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	6				15	15	6		3	1	40
හදිසි අවස්ථා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය					98	26	20		1	1	146
පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය	5				10	3	2		2		17
වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව විශේෂවේදී උපාධිය	10				28	11	4				43
වෘද වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී. උපාධිය	4				10						10
රක්තවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	3				24	11	18		1	3	57
සෞඛ්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය	9				20	28	2				50
පටක ව්‍යාධිවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	20				28	21	5		2		56
වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම්. ඩී. උපාධිය					0	2					2
වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්. ඩී. උපාධිය					28	30	14			5	77
වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය	8				31	10	8		1	4	54

වෛද්‍ය පරපෝෂවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	1				2	1					3
වෛද්‍යවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	93				276	217	100		12	18	623
නාරීවේදය හා ප්‍රසවවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	31				92	55	30		4		181
ඕ.එම්. එෆ්. ශල්‍යවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	11				26	10	7		1		44
අක්ෂිවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	20				47	15	11			1	74
මුඛ ව්‍යාධිවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	2020 වසර තුළ නවක බඳවාගැනීම් නොමැත										
දන්ත හනු චිකිත්සාව පිළිබඳව එම්.ඩී. උපාධිය	4				10	4	3		1		18
විකලාංග ශල්‍යවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	6				37	28	8		1		74
කර්ණනාසිකස්වරාලවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	2				12	10	4				26
ළමාචිකිත්සාව පිළිබඳව එම්. ඩී. උපාධිය	45				151	78	38		6	6	279
මනෝ චිකිත්සාව පිළිබඳව එම්. ඩී. උපාධිය	20				65	33	17				115
විකිරණවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	28				96	39	15		1	2	153
පුනර්ජීවන දන්තචිකිත්සාව පිළිබඳව එම්. ඩී. උපාධිය	3				15	3	4				22
ක්‍රීඩා හා ව්‍යායාම් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය	12				20						20
ශල්‍යවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	41				146	94	49		3	2	294
පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය	4				15	9	3				27
මෙථුනවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	5				10	14	3		2	1	30
වෛරසවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය					5	1	3				9
TOTAL	986	78	547	210	1547	914	448	0	51	60	3855

සටහන

(අ) : 2020. 12. 31 වනවිට වසර 2ක කාලයක් තුළ විදේශ පුහුණු ලබමින් සිටින පුද්ගලයන්
(ආ): 2020. 12. 31 වනවිට වසර 3 වැනි වසර විදේශ පුහුණු ලබමින් සිටින පුද්ගලයන්
(ඇ): 2020 වනවිට ආපසු පැමිණ මණ්ඩළ සහතිකධාරීත්වය ලබා සිටින පුද්ගලයන්
(ඈ): 2020 වනවිට ආපසු පැමිණ මණ්ඩළ සහතිකධාරීත්වය අපේක්ෂාවෙන් සිටින පුද්ගලයන්

14.1.අ. වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය (MERC)

වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය (MERC)

2020 වසර වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයට තවත් සාර්ථක වසරක් වූ අතර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් මෙහෙයවන ලද වැඩසටහන් රැසක මූලිකත්වය දැරීමේ අවස්ථාව 2020 වසරේදී ද වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයට හිමිවිය.

<u>අධ්‍යයන කටයුතු</u>

<u>වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් සම්බන්ධීකරණය කරනු ලබන පාඨමාලාවන්</u>

බහුවිෂය ක්ෂේත්‍ර අධ්‍යයනය පිළිබඳව අධ්‍යයන මණ්ඩල

1. **වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව, වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම්.ඩී. උපාධිය:**

වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව යනු වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සහ වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම්.ඩී උපාධිය දක්වා ගමන් කළ හැකි දස මාසික අර්ධකාලීන පාඨමාලාවකි.

2020 වසරේ වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍ර පුහුණුව සඳහා අපේක්ෂකයින් 15 දෙනෙකු එක්වූහ.

2020 වසර තුළ පුහුණුලාභීන් දෙදෙනෙකු තම දේශීය පශ්චාත් එම්.ඩී පුහුණුව අරඹන ලද අතර අනෙක් පුහුණු ලාභීන් දෙදෙනා තම පූර්ව එම්. ඩී පුහුණුව හදාරමින් සිටිති, එක් පුහුණු ලාභිණියක් තම පශ්චාත් එම්. ඩී. විදේශ පුහුණුව ආරම්භ කළාය.

2. **වෛද්‍ය ධූලකවේදය පිළිබඳව එම්.එස්.සී. උපාධිය:**

මෙය අන්තර්ජාලය භාවිතයෙන් Moodle ඉගෙනුම් කළමණාකරණ ක්‍රමවේදය තුළින් සිදුකෙරෙන ද්විවාර්ෂික දුරස්ථ අධ්‍යයන වැඩසටහනකි. දෙවන කාණ්ඩයේ දේශීය පුහුණුලාභීන් 21 දෙනෙකු සහ විදේශීය පුහුණුලාභීන් 18 දෙනෙකු වෛද්‍ය ධූලකවේදය පිළිබඳව **I** කොටසට අදාළ විභාගය සඳහා පෙනී සිටිය අතර දේශීය පුහුණුලාභීන් 6 දෙනෙකු සහ විදේශීය පුහුණුලාභීන් 10 දෙනෙකු වෛද්‍ය ධූලකවේදය පිළිබඳව **I** කොටසට අදාළ විභාගය සමත් වූහ. දේශීය පුහුණුලාභීන් 16 දෙනෙකු සහ විදේශීය පුහුණුලාභීන් 4 දෙනෙකු තම වෛද්‍ය ධූලකවේදය පිළිබඳව පුහුණු වැඩසටහනෙහි දෙවන වර්ෂය සඳහා සම්බන්ධව සිටිති.

<u>වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය මගින් පුහුණුලාභීන් උදෙසා 2020 වසරේදී පවත්වනු ලැබූ වැඩමුළු</u>

2020 වසරේදී පහත වැඩමුළු පවත්වන ලදී

1. පර්යේෂණ ක්‍රමවේදයන් පිළිබඳ වැඩමුළු
   අ. 2020 මාර්තු 2,3,4,5,6, සහ සැප්තැම්බර් 7 - සහභාගීවූවන් ගණන 72

2. වෛද්‍ය වෘත්තියේ යෙදීමේදී එහි ආචාරවිධි සහ වෘත්තීකභාවය සම්බන්ධයෙන් එම්.ඩී. පුහුණුලාභීන් සඳහා වැඩමුළුව
   අ. 2020 ජනවාරි 17, 18, 23, සහ 24 - සහභාගීවූවන් ගණන 101
   ආ. 2020 පෙබරවාරි 6, 7, 14, සහ 29 - සහභාගීවූවන් ගණන 96
   ඇ. 2020 මැයි 22, 23, 29 සහ 30 - සහභාගීවූවන් ගණන 187
   ඈ. 2020 ජූනි 26, 27, සහ ජූලි 3, 4 - සහභාගීවූවන් ගණන 207
   ඉ. අගෝස්තු 7, 8, 14 සහ 15- සහභාගීවූවන් ගණන 106
   ඊ. 2020 සැප්තැම්බර් 18, 19, 25 සහ 26 - සහභාගීවූවන් ගණන 98
   එ. 2020 ඔක්තෝබර් 16, 17, 23 සහ 24 - සහභාගීවූවන් ගණන 186
   ඒ. 2020 නොවැම්බර් 20, 21, 27 සහ 28 - සහභාගීවූවන් ගණන 170
   ඔ. 2020 දෙසැම්බර් 11, 12,18 සහ 19 - සහභාගීවූවන් ගණන 122

3. Endometrial Carcinoma පිළිබඳව වික්‍රිරණවේදය පිළිබඳව එම්. ඩී. පුහුණුලාභීන් සඳහා වූ දේශනය සහ ස්ලයිඩ් සම්මන්ත්‍රණය - 2020 ජනවාරි 06 - සහභාගී වූවන් ගණන 62
4. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාවන් පිළිබඳව වැඩමුළුව - එය ක්‍රියාත්මක වන ආකාරය : නිර්වින්දනවේදය පිළිබඳව පුහුණුලාභීන් සඳහා ප්‍රායෝගිකත්වයන් සහ දේශපාලනය - 2020 ජූනි 20 - සහභාගීවූවන් ගණන 58
5. සායනික වෝහාරික වෛද්‍ය විද්‍යාව සහ Grand Clinico-Pathological Round පිළිබඳව වැඩමුළුව - 2020 ජූනි 26 - සහභාගීවූවන් ගණන 54
6. වික්‍රිරණවේදය පිළිබඳව පුහුණුලාභීන් සඳහා සාර්ථක පර්යේෂණ ව්‍යාපෘතියක් පැවැත්වීමෙහි ලා අතවශ්‍ය වන ශක්‍යතාවන් පිළිබඳව වැඩමුළුව - 2020 ජූලි 09 - සහභාගීවූවන් ගණන 63
7. වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව පුහුණුලාභීන් සඳහා කෝවිඩ් 19 රෝගයේ ව්‍යාධිවේදය(රෝග විනිශ්චය) පිළිබඳව ආරාධිත දේශනය - 2020 ජූලි 15 - සහභාගී වූවන් ගණන 62
8. නාරිවේදය හා ප්‍රසවවේදය පිළිබඳව පුහුණුලාභීන් සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන දිනය (I කොටස) - 2020 ඔක්තෝබර් 08 - සහභාගීවූවන් ගණන 22
9. නාරිවේදය හා ප්‍රසවවේදය පිළිබඳව පුහුණුලාභීන් සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන දිනය (II කොටස) - 2020 සැප්තැම්බර් 3 - සහභාගීවූවන් ගණන 22
10. රසායනික ව්‍යාධිවේදය පිලිබඳව පුහුණුලාභීන් සඳහා රසායනික ව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී. උපාධියෙහි II කොටස සඳහා විභාග පුහුණුව - 2020 නොවැම්බර් 06 - සහභාගීවූවන් ගණන 19
11. වෝහාරික වෛද්‍ය විද්‍යාව පිලිබඳව පුහුණුලාභීන් සඳහා වෝහාරික ළමා චිකිත්සක සහ පරිසූතික ව්‍යාධිවේදය පිලිබඳව ආරාධිත දේශනය - 2020 නොවැම්බර් 07 - සහභාගීවූවන් ගණන 33
12. නාරිවේදය හා ප්‍රසවවේදය පිළිබඳව පුහුණුලාභීන් සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන දිනය (III කොටස) - 2020 නොවැම්බර් 12 - සහභාගීවූවන් ගණන 22
13. පශ්චාත් උපාධි පර්යේෂණ සංසදය (PGRF), වෝහාරික වෛද්‍ය විද්‍යාව පිලිබඳව පශ්චාත් උපාධි පුහුණුලාභීන් අතර පර්යේෂණ සිදුකිරීම දිරිගැන්වීම(I කොටස) - 2020 නොවැම්බර් 20 - සහභාගීවූවන් ගණන 35
14. වෝහාරික ළමා චිකිත්සක සහ පරිසූතික ව්‍යාධිවේදය සහ Grand Clinico-Pathological Round පිළිබඳව වැඩමුළුව - 2020 දෙසැම්බර් 14 - සහභාගීවූවන් ගණන 54
15. කාර්ය සම්හන්ධ ආතතිය සහ නිර්වින්දනවේදය සහ දැඩි සත්කාර ඒකකයන්හි ජ්‍යෙෂ්ඨ රෙජිස්ට්‍රාර්වරුන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම පිළිබඳව වැඩමුළුව 2020 දෙසැම්බර් 19 - සහභාගීවූවන් ගණන 52
16. පශ්චාත් උපාධි පර්යේෂණ සංසදය (PGRF), වෝහාරික වෛද්‍ය විද්‍යාව පිලිබඳව පශ්චාත් උපාධි පුහුණුලාභීන් අතර පර්යේෂණ සිදුකිරීම දිරිගැන්වීම (II කොටස) - 2020 නොවැම්බර් 30 - සහභාගීවූවන් ගණන 35
17. පර්යේෂණ සහාය මධ්‍යස්ථානය මාසික පර්යේෂණ හමු

	දිනය	**මාතෘකාව**	**සම්පත් දායකයා**
1	2020 සැප්තැම්බර් 24	සාහිත්‍ය විමර්ශණය	වෛද්‍යාචාර්ය කේ.එම්.එන්. පෙරේරා
2	2020 ඔක්තෝබර් 29	ඔබගේ සංඛ්‍යාන පර්ය්ෂණය/විභාගය තෝරාගැනීම පිළිබඳව ඉඟි	මහාචාර්ය ඒ. පත්මේස්වරන්
3	2020 නොවැම්බර් 19	Scale Development පරිමාණ ගොඩනැංවීම	වෛද්‍යාචාර්ය මාධව චන්ද්‍රතිලක
4	2020 දෙසැම්බර් 17	වෛද්‍ය විද්‍යා පර්යේෂණ සඳහා ප්‍රමාණ සාම්පළ ගණනය (Sample size calculation)	වෛද්‍යාචාර්ය රුවන් ෆර්ඩිනැන්ඩෝ

<u>පුහුණුකරුවන් සඳහා වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය (MERC) විසින් 2020 වසරේදී පවත්වනු ලැබූ වැඩමුළු</u>

20120 වසරේදී පහත වැඩමුළු පවත්වන ලද අතර ඊට අමතරව අධ්‍යයන මණ්ඩලයන්හි ඉල්ලීම මත අමතර වැඩමුළු සංවිධානය කරන ලදී.

1. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ *පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩමුළුව*

   අ. 2020 පෙබරවාරි 19 සහ 26 - සහභාගීවූවන් ගණන 25

   ආ. 2020 ජූලි 2 සහ 7 - සහභාගීවූවන් ගණන 43

   ඇ. 2020 අගෝස්තු 12 සහ 20 - සහභාගීවූවන් ගණන 47

   ඈ. 2020 ඔක්තෝබර් 7 සහ 14 - සහභාගීවූවන් ගණන 43

   ඉ. 202 නොවැම්බර් 4 සහ 11 - සහභාගීවූවන් ගණන 40

2. විභාග පරීක්ෂකවරුන් පුහුණුකිරීමේ වැඩසටහන

   අ. 2020 පෙබරවාරි 05 සහ 12 - සහභාගීවූවන් ගණන 26

   ආ. 2020 මාර්තු 12 - සහභාගීවූවන් ගණන 43

   ඇ. 2020 ජූනි 17 සහ 26 - සහභාගීවූවන් ගණන 111

   ඈ. 2020 අගෝස්තු 21 සහ 26 - සහභාගීවූවන් ගණන 28

   ඉ. 2020 සැප්තැම්බර් 23 සහ 30 - සහභාගීවූවන් ගණන 30

   ඊ. 2020 නොවැම්බර් 18 සහ 25 - සහභාගීවූවන් ගණන 18

3. වෝහාරික වෛද්‍ය විද්‍යා පුහුණුලාභීන් සඳහා වෝහාරික මානව විද්‍යාව පිළිබඳව වැඩමුළුව - 2020 මාර්තු 06 - සහභාගීවූවන් ගණන 46
4. මනෝ චිකිත්සනය පිළිබඳව විභාග පරීක්ෂකවරුන් සඳහා විභාග පරීක්ෂකවරුන්ගේ පුහුණුව - 2020 සැප්තැම්බර් 02 - සහභාගීවූවන් ගණන 18
5. පවුල් වෛද්‍ය විද්‍යාව පිලිබඳව පුහුණුකරුවන් සඳහා මූඩ්ල් ඔස්සේ සිදුකෙරෙන මාර්ගගත අන්තර් ක්‍රියාකාරීත්ව ඉගැන්වීම පිළිබඳව වැඩමුළුව - 2020 සැප්තැම්බර් 08 - සහභාගීවූවන් ගණන 19
6. රසායනික ව්‍යාධිවේදය පිළිබඳව විභාග පරීක්ෂකවරුන් සඳහා විභාග පරීක්ෂක පුහුණුව - 2020 සැප්තැම්බර් 23 - සහභාගීවූවන් ගණන 19
7. දන්ත හනු චිකිත්සාව පිළිබඳව විභාග පරීක්ෂකවරුන් සඳහා විභාග පරීක්ෂක පුහුණුව - 2020 සැප්තැම්බර් 24 - සහභාගීවූවන් ගණන 19
8. වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව විශේෂ උනන්දුවක් දක්වන පුහුණුකරුවන් සඳහා වැඩමුළුව - 2020 දෙසැම්බර් 04

<u>වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන සඟරාව (JPGIM)</u>

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන සඟරාවෙහි පරිපාලනමය සහ සංස්කරණ කටයුතු සම්බන්ධීකරණය වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය මගින් සිදුකරනු ලැබේ. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන සඟරාවෙහි හත්වන වෙළුමෙහි 1 සහ 2 නිකුතු ප්‍රකාශයට පත්කරන ලදී.

<u>වෛද්‍ය වෘත්තික ආචාරධර්ම සමාලෝචන කමිටුව (ERC/PGIM)</u>

2020 වසරේදී ප්‍රජා වෛද්‍ය විද්‍යාව/දන්ත වෛද්‍ය විද්‍යාව/වෛද්‍ය පරිපාලනය/ජෛව වෛද්‍ය විඥාපන විද්‍යාව/ රක්ත ව්‍යාධිවේදය/ සායනික අර්බුදවේදය/සෞඛ්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්.ඩී. වැඩසටහන/ වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය/මෙථුනවේදය/ මනෝ චිකිත්සනය/පවුල් වෛද්‍ය විද්‍යාව/ නිර්වින්දනවේදය/විකලාංග ශෛල්‍යවේදය/චර්මවේදය/ ළමා රෝග විද්‍යාව/ නාරී හා ප්‍රසවවේදය/ වාතරක්තවේදය සහ පුනරුත්ථාපනය සහ ආපදා කළමණාකරණ එම්.ඩී. උපාධි පුහුණුලාභීන්ගේ අයදුම්පත්

211 ක ප්‍රමාණයක් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන වෛද්‍ය වෘත්තික ආචාරධර්ම සමාලෝචන කමිටුව විසින් පරීක්ෂාකර බලනු ලැබිනි. කමිටුවෙහි ලේඛන පරිපාලන කටයුතු උදෙසා සහාය වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් සැපයේ.

<u>වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය</u>

AAAEC ය විසින් වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයෙහි (MERC) වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයක් පිහිටුවීම නිර්දේශ කරන ලද අතර එම කමිටුවෙහි සාමාජිකයන් ලෙස මහාචාර්ය ලිලානි ඒකනායක, මහාචාර්ය ශාලිනි ශ්‍රී රන්ගනාදන්, වෛද්‍යාචාර්ය කමනි සමරසිංහ, වෛද්‍යාචාර්ය සුදත් සමරවීර, වෛද්‍යාචාර්ය පණ්ඩුල සිරිබද්දන සහ වෛද්‍යාචාර්ය රිස්කා ඉෂාන් ය නඅය නම් කරන ලදී. 2020 සැප්තැම්බර් මස සිට මෙම කමිටුව මාසිකව රැස්වේ.

14.2 ඇගයුම් සහ විභාග කටයුතු

14.2.1. විභාග

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් 2020 වසර තුළදී එම්.ඩී උපාධි විභාග 41 ක්, එම්.එස්.සී. උපාධි විභාග 03 ක්, පශ්චාත් උපාධි ඩිප්ලෝමා විභාග 14 ක්, පශ්චාත් උපාධි සහතික පත්‍ර විභාග 01 ක් සහ තෝරාගැනීමේ විභාග 40ක් පවත්වනු ලැබිනි. මෙම 2020 වසරේ පැවැත්වුනු විභාගයන් සඳහා අපේක්ෂකයන් 2146 ක් සහභාගී වූ අතර ඒ අතුරින් අපේක්ෂකයන් 835 දෙනෙක් සාර්ථක ප්‍රථිඵල අත්කරගෙන තිබිනි. සියළුම එම්.ඩී. උපාධි විභාග දේශීය විභාග පරීක්ෂකවරුන්ට අමතරව බාහිර විභාග පරීක්ෂකවරුන් විසින්ද අගයනු ලැබිනි **(Table 03).**

14.2.2. උපාධි ප්‍රධානෝත්සවය

කොළඹ විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලැබූ වාර්ෂික පශ්චාත් උපාධි ප්‍රධානෝත්සවයේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා, එම්.එස්.සී උපාධි සහ එම්.ඩී. උපාධි 969 ක් ප්‍රධානය කරන ලදී.

14.2.3. විදේශ පුහුණු

වගු අංක 04 හි දැක්වෙන අයුරින් පශ්චාත් උපාධි පුහුණුලාභීන් තම අනිවාර්යය විදේශ පුහුණු පිළිගත් පුහුණු මධ්‍යස්ථාන වෙතින් ලබාගැනීම සිදුවිය.

14.2.4. මණ්ඩල සහතිකකරණය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2020 වසර තුළදී විවිධ විශේෂඥතාවන්ගෙන් මණ්ඩල සහතිකකරණයන් 235 ක් ප්‍රදානය කරන ලදී. එබැවින් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මණ්ඩල සහතිකකරණය ලැබූ විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව 4284 දක්වා ඉහළ යනු ලැබිනි. **(වගු අංක 05).**

වගුව 3

බාහිර විභාග පරීක්ෂකවරුන් 2020

විභාගය	බාහිර විභාග පරීක්ෂක	රට
එම්.ඩී. උපාධිය (නිර්විින්දනවේදය) 1 කොටස සහ එම්.ඩී. උපාධිය(නිර්විින්දනවේදය) අවසාන කොටස (මාර්තු)	වෛද්‍ය ලලිතා වේදමී	එක්සත් රාජධානිය
	වෛද්‍ය ශ්‍රීධර් ගුම්මරාජු	එක්සත් රාජධානිය
එම්.ඩී. උපාධිය (නිර්විින්දනවේදය) 1 කොටස සහ එම්.ඩී. උපාධිය(නිර්විින්දනවේදය) අවසාන කොටස (අගෝස්තු)	වෛද්‍ය ක්‍රිස් ටිල්	එක්සත් රාජධානිය
	වෛද්‍ය රාජාමනී හේතුරාමන්	එක්සත් රාජධානිය
එම්.ඩී. උපාධිය (ප්‍රජා වෛද්‍ය විද්‍යාව)/ එම්.ඩී. උපාධිය (ප්‍රජා දන්ත චිකිත්සාව) 2 කොටස උපාධි නිබන්ධනය මගින් (දෙසැම්බර්)	මහාචාර්ය අර්විින්ද් කස්තුරි	ඉන්දියාව
	මහාචාර්ය බොබී ජෝසෙෆ්	ඉන්දියාව
	මහාචාර්ය අවිනාශ් ශෙට්ටි	ඉන්දියාව
	මහාචාර්ය රාහුල් මල්හෝත්‍රා	සිංගප්පූරුව
	මහාචාර්ය කුර්යන් ජෝර්ජ්	ඉන්දියාව
	මහාචාර්ය සරත් ගුණතිලක	ඇමෙරිකාව
	මහාචාර්ය නාලිනී සතියකුමාර්	ඇමෙරිකාව
	ආචාර්ය එඩුවාඩෝ බාර්නබේ	ඕස්ට්‍රේලියාව
	මහාචාර්ය රොඩ්‍රිගෝ මැරීනෝ	ඕස්ට්‍රේලියාව
	මහාචාර්ය කේ.ආර්. නායර්	ඉන්දියාව
	මහාචාර්ය ඩී. බචානි	ඉන්දියාව
	මහාචාර්ය ශාන්තිදානි මින්ස්	ඉන්දියාව
	මහාචාර්ය ශ්‍යාමලී ධර්මගේ	ඕස්ට්‍රේලියාව
	ආචාර්ය රොස්ලාන් සාවුබ්	ඉන්දියාව
	මහාචාර්ය විනෝද් ජෝසප් ආබ්‍රහම්	ඉන්දියාව
	මහාචාර්ය රාජේශ් කුමාර්	ඉන්දියාව
	මහාචාර්ය ටී කේ ජෙනා	ඉන්දියාව
	මහාචාර්ය ශාන්ති අමරතුංග	නවසීලන්තය
	මහාචාර්ය රෝහන් ජයසූරිය	ඕස්ට්‍රේලියාව
එම්.ඩී. උපාධිය (සායනික අර්බුදවේදය) 1 කොටස අගෝස්තු	මහාචාර්ය පීටර් හොස්කින්	එක්සත් රාජධානිය
එම්.ඩී. උපාධිය (සායනික අර්බුදවේදය) 2 කොටස	මහාචාර්ය රිචඩ් කෝවන්	එක්සත් රාජධානිය
එම්.ඩී. උපාධිය (චර්මවේදය) - ජනවාරි	ආචාර්ය පෝල් යෙසුඩියන්	එක්සත් රාජධානිය
එම්.ඩී. උපාධිය (මුඛ හා හනුවක්ත්‍ර ශල්‍යවේදය) පෙබරවාරි	ආචාර්ය අයියද් එම්. ක්‍යුඩයිරට්	එක්සත් රාජධානිය
